# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 39 දරන
# සදගිරිගල ආරණ්‍ය සේනාසනයේ
# පාලක සභාව
# (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 අගෝස්තු මස 10 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1992 අගෝස්තු මස 14 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

**කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.**

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

## 1992 අංක 39 දරන සඳගිරිගල ආරණ්‍ය සේනාසනයේ පාලක සභාව (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1992 අගෝස්තු මස 10 දින]

එල්. ඩී.—ඕ. 101/90

**සඳගිරිගල ආරණ්‍ය සේනාසනයේ පාලක සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"සඳගිරිගල ආරණ්‍ය සේනාසනයේ පාලක සභාව" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබුණු හෙයින් ද : **පූර්විකාව.**

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු එකී සංගමය විසින් මේ දක්වා සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් හා ඒ සංගමය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1992 අංක 39 දරන සඳගිරිගල ආරණ්‍ය සේනාසනයේ පාලක සභාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. මෙහි මින්මතු "පාලක සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන සඳගිරිගල ආරණ්‍ය සේනාසනයේ පාලක සභාවේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු සාමාජිකයන් ලෙස ඇතුළත් කර ගනු ලබන තැනැත්තන් මේ පනත ආරම්භ වන දිනයෙහි සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "සඳගිරිගල ආරණ්‍ය සේනාසනයේ පාලක සභාව" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද ඒ සංස්ථාව විසින් හා එයට විරුද්ධව ද එකී නාමයෙන් සියලු අධිකරණයන් හි නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ ද තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය එයට ඇත්තේ ය. **සඳගිරිගල ආරණ්‍ය සේනාසනයේ පාලක සභාව සංස්ථාගත කිරීම.**

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— **සංස්ථාවේ පොදු පරමාර්ථ.**

(අ) සඳගිරිගල ආරණ්‍ය සේනාසනය පාලනය කිරීම, පවත්වාගෙන යාම හා සංවර්ධනය කිරීම;

(ආ) සඳගිරිගල ආරණ්‍ය සේනාසනයෙහි වැඩ වසන භික්ෂූන් වහන්සේලා සහ එහි භාවනානුයෝගීව හා සිල් සමාදන්ව සිටින ගිහියන්ගේ අවශ්‍යතා සපුරාලීම;

(ඇ) සඳගිරිගල ආරණ්‍ය සේනාසනයේ ආධාරකරුවන්ගේ හා එහි පැමිණෙන වන්දනාකරුවන්ගේ ආගමික කටයුතුවලට පහසුකම් සැලසීම;

(ඇ) බෞද්ධ දර්ශනය හා බෞද්ධ ජීවන මාර්ගය ආරක්ෂා කිරීම හා ප්‍රචාරය කිරීම ; හා

(ඉ) ශ්‍රී ලංකාවේ හා පිටරට වෙනත් බෞද්ධ සංවිධාන සමග මිත්‍ර සම්බන්ධතා පැවැත්වීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතිගත විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් හා පරිත්‍යාග භාරගැනීමේ හා එකතු කිරීමේ ද ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේද නිලධරයන් සහ සේවකයන් සේවයේ යෙදවීමේ, සේවයේ නියුක්ත කිරීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුලුව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් සාක්ෂාත් කරගැනීම හා ප්‍රවර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය හෝ හිතකර කවර හෝ ක්‍රියා, කරුණු හා දේවල් ඉටුකිරීමේ ද ක්‍රියාවේ යෙදවීමේ ද බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

5. යම් මිළයට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, නැතහොත් අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් මගින් හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත සතු කරනු ලබන යම් නිශ්චල හෝ චංචල දේපළක් භාර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් බලය ඇති අතර එවැනි සියලුම දේපළ සංස්ථාව විසින් මේ පනතේ වූ කාර්ය සඳහා දරනු ලැබිය යුතු ය. තවද, සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සංස්ථාව සතු වන්නේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

6. (1) සංස්ථාවේ කටයුතු තත්කාලයේ බල පවත්නා සංස්ථාවේ රීතිවලින් කටයුතු සලස්වා ඇත්තා වූ ද ඒ රීතිවලට අනුකූලව තෝරාපත් කරගනු ලබන්නාවූ ද නිලධරයන්ගෙන් හා වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත කළමනාකරණ කමිටුවක් විසින් ඒ රීතිවලට යටත්ව පරිපාලනය කළ යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ කමිටුව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරතුවම වූ දිනයේදී ධුර දැරූ පාලක සභාවේ කළමනාකරණ කමිටුව විය යුතු ය.

සංස්ථාවේ නීති.

7. (1) පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේය :—

(අ) සාමාජිකයන් වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුලත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම;

(ආ) නිලධරයන් තෝරා පත් කිරීම, නිලධරයන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන් තම ධුරය හිස් කිරීම, ඔවුන් ධුරයෙන් නෙරපීම අහ ඔවුන්ගේ බලතල, චර්යාව සහ කාර්ය ;

(ඇ) කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් තෝරා පත් කිරීම, ඒ කමිටුවේ බලතල, චර්යාව සහ කාර්ය ;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) සංස්ථාවේ රැස්වීම් සහ කළමනාකරණ කමිටුවේ රැස්වීම් කැඳවීම, ඒ රැස්වීම් පැවැත්වීම, ඒවා පවත්වන වේලාවල්, ස්ථාන, දැන්වීම් සහ ඒ රැස්වීම්වල න්‍යාය පත්‍ර සහ රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය හා සාකච්ඡා කළ යුතු කරුණු ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ එහි ගිණුම් පවත්වාගෙන යාම හා විගණනය කිරීම ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් පළමුවන උප වගන්තිය යටතේ රීති සාදනු ලැබිය හැකි ආකාරයෙන්ම සහ එවැනිම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

8. මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පාලක සභාවේ පැවැති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට පාලක සභාවට අය විය යුතු සියලු ණය හෝ ගෙවිය යුතු දායක මුදල් සහ සාමාජික මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය. පාලක සභාව විසින් ගෙවිය යුතු සහ පාලක සභාවට අයවිය යුතු ණය.

9. සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ සභාපති සහ ලේකම් ඉදිරිපිට දී මිස කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතුය. තව ද ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**10.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් විසින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ වෙනත් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**11.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පතත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 255, බෞද්ධාලෝක මාවත, කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැක.